

# කපුටු හාමිට ප්‍රශ්නයක්

වයි.එම්.පී.ජී. සතිකා මේධාවි යාපා බණ්ඩාර

# කතෘ අයිතිය

**කෘතියේ නම : කපුටුහාමිට ප්‍රශ්නයක්**

**කතෘගේ නම : වයි.එම්.පි.ජී. සතිකා මේධාවි යාපා බණ්ඩාර**

**චිත්‍ර : වයි.එම්.පි.ජී. සතිකා මේධාවි යාපා බණ්ඩාර**

ISBN : 978-624-206-643-1

# කතෘගේ වෙනත් කෘති

**ආඩම්බර සමනලයා - 2021**

ISBN - 978-624-206-087-3

# පිදුම

ගුණ නැණ පහදා දෙමින්
නිරන්තරයෙන් අපට ශක්තියක් වූ
අපගේ පාසල් විදුහල්පතිතුමියටත්,
පංති භාර ගුරුතුමියටත් ඉතා
ගෞරවයෙන් මෙම කෘතිය පුද කර
සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැඟීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැඟී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතියට එකතු වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01



එකමත් එක කාලෙක ලස්සන කැලයක් තිබුණා. ඒ කැලේ කපුටෙක් ජීවත් වුණා. මේ කපුටා හැමදාම දුකෙන් හිටියේ එයා කළුයි කියලා. "කැලේ සිටින සියළුම සතුන් මට වඩා ගොඩක් ලස්සනයි." කියලා කපුටා හැම වෙලාවෙම තමාටම කියා ගත්තා.

ඉතිං දවසක් කපුටා තීරණය කළා. මේ ප්‍රශ්නය ගැන කැලේ රජා වුණ සිංහයාට කියලා විසඳුමක් ගන්න. ඒ නිසා එක දවසක් උදේම නැගිටලා සිංහ රජාගේ ගුහාවට යන්න කපුටා පිටත් වුණා.

‘‘රජතුමනි, රජතුමනි ඔබතුමාට සුභ උදෑසනක්’’
‘‘කවුද මේ උදේ පාන්දරම ‘‘ආනේ.... මේ කපුටුහාමිනේ... සුභ උදෑසනක්, මොකෝ මේ උදේ පාන්දරම’’

‘‘රජතුමනි මට ලොකු හිතේ අමාරුවක් තියනවා.’’
‘‘අනේ ඇයි කපුටුහාමිට මොකක්ද තියන ප්‍රශ්නේ’’?
‘‘රජතුමනි, කැලේ සිටින සියළුම සතුන් හරිම ලස්සනයි. මං විතරක් කළුම කළු පාටයි. මං ඒ ගැන ගොඩක් දුකින් ඉන්නේ’’

‘‘හ්ම්... කපුටුහාමි ඔයා දන්නවා නේද අපේ හංස රැජිණව ඔයා ගිහින් හංස රැජිණගෙන් අහන්නකෝ එයාගේ ලස්සන ගැන එයා හිතන්නේ මොකක්ද කියලා.’’
‘‘හොඳමයි රජතුමනි මං ගිහින් එන්නම්’’



කපුටුහාමි නැවත පියාඹගෙන හංස රැජිණගේ පොකුණ දෙසට ගියා.

පොකුණේ සිටින හංස රැජිණ දැක්ක කපුටුහාමි මෙසේ විමසුවා.



''හංස රැජිණ සුබ දිනයක් වේවා!

ඔබගේ ලස්සන ගැන ඔබට සතුටු ඇති නේද?



''අනේ  කපුටුහාමි මගේ ලස්සන ගැන මං කොහොම සතුටු වෙන්නද? මං සුදුම සුදු පාටයි.
බලන්නකෝ අර මොනරහාමි දිහා.
එයාගේ ඇගේ ලස්සන පාට ගොඩක් තියෙනවා.''
මෙසේ හංස රැජිණ කපුටුහාමිට කිව්වා.

''ඒ කියන්නේ ඔබත් ඔබේ පාටට අකමැතියි නේද?
මේ ගැන ඇසූ කපුටුහාමි මොනරහාමිවත් සොයාගෙන පියාඹලා ගියා.



පිල් විදහාගෙන ලස්සනට ඇවිදිමින් සිටි මොනරහාමිව දුටු කපුටුහාමි ඒ අසල ගසක නැවතුණා. ටික වේලාවක් මොනරහාමිගේ ලස්සන බැලුවා. එයා තාලෙට ඇවිදින විදිහ,එයාගේ ශරීරයේ තිබෙන අපූරු වර්ණ දෙස කපුටුහාමි බලාගෙන හිටියා. මොනරහාමි දැක්කා. මේ කපුටුහාමි තමන් දෙස බලාගෙන ඉන්නවා කියලා. ඒ නිසා මොනරහාමි කපුටු හාමිට කතා කළා.

''කොහොමද කපුටුහාමි මොකද මේ මං දිහා බලාගෙන කල්පනා කරන්නේ?''

''මං කල්පනා කරේ ඔයා කොච්චර ලස්සනයිද කියලා. ඔයාගේ ඇඟේ ලස්සන පාට ගොඩක් තියනවා. බලන්නකෝ මං නම් කළුම කළුයි.'' කියලා කපුටුහාමි කිව්වා.

"අනේ කපුටුහාමි මං කොච්චර ලස්සන වුණාත් ඒ ලස්සන නිසා මං ගොඩක් කරදර වලට මුහුණ දෙනවා. මාව බලන්න එන මිනිස්සු කැමති මට නෙවෙයි.

මගේ පිහාටු වලට ඉතිං එයාලා මගේ පිහාටු ඔක්කොම ගලවගෙන යනවා." කියලා මොනරහාමි කිව්වා.





''එතකොට ඔයත් ඔයාගේ පාටට කැමති නැද්ද? කියලා කපුටුහාමි ඇසුවා.

මොනරහාමි මෙසේ පැවසුවා.

''නැහැ යාළුවේ, මං ලස්සන වුණාට මිනිස්සු මට බය නෑනේ. ඉතිං මේ කැලේ ඉන්න ලස්සනම තේජවන්තම කෙනා තමයි. සිංහ රජතුමා, ඒ නිසා එයා ළඟට යන්න මිනිස්සු බයයි.''

මෙය අසා සිටි කපුටුහාමි නැවත සිංහ රජතුමා සොයාගෙන පියඹලා ගියා....

"රජතුමනි, රජතුමනි මං සොයා ගත්තා. මේ කැලේ සිටින ලස්සනම කෙනා ඔබතුමා කියලා."

කපුටුහාමි ඉතාමත් ප්‍රීතියෙන් එය රජතුමාට පැවසුවා.

රජතුමා හයියෙන් සිනා සී මෙසේ පැවසුවා.





‘‘කපුටුහාමි මං ලස්සනම කෙනා නම් ඔයත් ලස්සනයි. මොකද මගේ ශරීරයෙත් විවිධ වර්ණ නැහැ නේද? ඒ වගේම මං ගොඩක් ආසයි මිනිස්සු ළඟට ගිහින් සුරතල් වෙන්න. ඒත් මිනිස්සු මට බය නිසා මගේ ළඟට එන්නෙත් නෑ. ආවත් මට කරදර කරලා තමයි මාව අල්ලගන්නේ.

ඒ නිසා මගේ ලස්සනත් මට වැදගත් වෙන්නේ නැහැ.’’



කපුටුහාමි තනියම මෙසේ හිතුවා. "සිංහ රජතුමාත් එයාගේ පෙනුමට කැමති නැහැ. හංස රැජිණත්, මොනරහාමිත්, එයාලගේ පෙනුමට කැමති නැහැ. හැමෝම තමන් ළඟ තියන දේට වඩා වෙනත් කෙනෙකු ළඟ තිබෙන දේකට ආස කරන්නේ. මට හිතෙන්නේ අපි අපේ ළඟ තියන දේවල් ගැන සතුටු වෙන්න ඕනි. අපි ළඟ නැති දේවල් ගැන හිතලා දුක්වෙන එකෙන් වැඩක් නැහැ." කියලා කපුටුහාමි තේරුම් ගත්තා.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමක් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනය හේතු කොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත් කතුවරයන්ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟා වීමට නූතන තාක්‍ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉහවල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනුම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවියේ දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යාත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකයේ දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට  
සෙනවිරත්න මහලේකම්  
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01



වයි.එම්.පී.ජී. සතිකා මේධාවි යාපා බණ්ඩාර

ISBN - 978-624-206-643-1

මිල  
රු. 200.00